**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය - 2017**

**--------------------------------------------------------**

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංවිධානයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංවිධානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංවිධානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය පිහිටුවීම**

---

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ පාංශු පර්යේෂණ විද්‍යාගාරය යනාදී වෙනත් ආයතන විසින් සිදු කරමින් තිබුණු කාර්යයන් ක්‍රියාත්මක කිරීමට වෙනම ආයතනයක් පිහිටුවීමේ අරමුණින්, 1993 සැප්තැම්බර් 29 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 93/340/173 ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය පිහිටුවා තිබුණි. මෙම සංවිධානය පාර්ලිමේන්තු පනතක් යටතේ සංස්ථාපනය කර නොතිබුණු හෙයින්, එමගින් ඉදිකිරීම් කටයුතු සඳහා නිකුත් කළ සහතිකවල වලංගුභාවය ගැටළුකාරී විය. තවද, අවදානම් සහිත ප්‍රදේශවල සිදු කරනු ලබන ඉදිකිරීම් කටයුතුවලට සම්බන්ධ පුද්ගලයින්ට එරෙහිව පර්යේෂණ සංවිධානය විසින් සිදුකළ යුතු පසුවිපරම් කටයුතු සඳහා පවතින ඉඩකඩ සීමිත වී තිබුණි.

**1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

---

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 48 ඡේදය පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටක දී හැර වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් නොකල යුතු වුවද සංවිධානයේ අංශ 06 මගින් උපයාගෙන තිබුණු රු.මිලියන 814.73ක ආදායම ඒ සඳහා දැරූ වියදම රු.මිලියන772.99 ක් හිලව් කර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ රු.මිලියන 41.74 ලෙස දක්වා තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ ගොඩනැගිලි කුලී වශයෙන් ගෙවා තිබුණ රු. 520,000 ක මුදලක් නව විද්‍යාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වැයකළ ප්‍රාග්ධන වියදමක් ලෙස නොනිමි වැඩ යටතේ ගිණුම් ගතකර තිබුණි.

(ආ) සේවාලාභී ආයතන තුනකින් අත්තිකාරම් වශයෙන් සමාලෝචිත වර්ෂය තුලදී ලැබී තිබුණු රු. මිලියන 1.65 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවල ලැබුණු අත්තිකාරම් යටතේ නොදක්වා ණයගැති වටිනාකමට හිලව් කර දක්වා තිබුණි.

(ඇ) මානව ජනාවාස සැලසුම් හා පර්යේෂණ සහ නාය යෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ යන අංශ විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රජා මූලික පූර්ව අනතුරු ඇඟවීමේ, ස්වයංක්‍රිය වර්ෂාමාන සහ අවදානම් ප්‍රදේශ සිතියම්කරණය යන ව්‍යාපෘති වල වියදම් තුලට සංවිධානයේ ආයතනික අංශයට අදාළ පොදු කාර්යය වියදම් රු.මිලියන 19.82 ක් ද ඇතුලත් කර තිබීම හේතුවෙන් ආයතන අංශයේ පොදු කාර්යය වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

සංවිධානය විසින් එහි සේවක මණ්ඩල පිරිවැය පාලනය සඳහා වෙනම පාලන ගිණුමක් පවත්වා නොතිබීමත් වැටුප් හා වේතන පිරිවැය සංවිධානයේ විවිධ අංශ අතර බෙදා වෙන්කර තිබීමත් හේතුවෙන් සමස්ථ සේවක මණ්ඩල පිරිවැය මූල්‍ය ප්‍රකාශන වලින් හඳුනාගත නොහැකි විය.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට සංවිධානය වෙත අය විය යුතුව පැවති එකතුව රු.570,000 ක් වූ ටෙන්ඩර් තැන්පතු හා ටෙන්ඩර් ඇප තැන්පතු ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඉන් රු.440,000 ක ශේෂ වර්ෂ 03 කට වඩා පැරණි විය.

(ආ) නාය යෑම් අවදානම් තක්සේරු වාර්තා නිකුත් කිරීම වෙනුවෙන් ප්‍රාදේශීය සභා 05 කින් එකතුව රු.630,000 මුදලක් 2014 වර්ෂයේ සිට සංවිධානය වෙත ලැබිය යුතුව පැවතුණි.

(ඇ) ආයතනයෙන් සේවාවන් ලබාගැනීම සඳහා ගනුදෙනු කරුවන් විසින් ආයතනය වෙත ලබා දී තිබුණ මුදලින් අදාල කාර්යයන් ඉටුකල පසු ඉතිරි වූ රු.මිලියන 1.28 ක් නිරවුල් කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන වල තැන්පතු යටතේ දක්වා තිබුණි.

(ඈ) 2009 වර්ෂයේ සිට සංවිධානයේ මූල්‍ය ප්‍රකාශනවල නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු ලෙස රු.මිලියන 5.92 ක ශේෂයක් අඛණ්ඩව දක්වා තිබුණු නමුත් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂයක් වශයෙන් දක්වා නොතිබුණු බව නිරීක්ෂණය වූයෙන් එම මුදල අයකර ගැනීම අවිනිශ්චිතව පැවතුණි.

### 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම්

--------------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 754 සහ 756 | දිස්ත්‍රික් කාර්යාල 2 ක බඩු ලේඛණ පොත් වර්ෂ අවසානයේ තුලනය කර සත්‍ය ශේෂයන් එම ලේඛන වල ඇතුලත් කර නොතිබුණි. |
| (ආ) | 2013 ඔක්තෝබර් 13 දිනැති අංක 21/2103 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | අමාත්‍යාංශ ලේකම් වරයාගේ අනුමැතියෙන් තොරව සති අන්ත සහ රජයේ නිවාඩු දිනවල සේවය සඳහා නිලධාරීන් මසකට දින දෙකකට වැඩියෙන් |

| | | |
|---|---|---|
| | | සේවයේ යොදවා තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 2.27ක් ගෙවා තිබුණි. |
| (ඇ) | 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 දරන කළමණාකරණ සේවා චක්‍රලේඛණයේ 3.1 ජේදය. | චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන වලට පටහැනිව නිලධාරීන් 10 දෙනෙකු වෙත ප්‍රවර්ථන වර්ෂය තුලදී රු.මිලියන 1.17 ක දීමනා වැඩිපුර ගෙවා තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සංවිධානයේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 43.83 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 47.92 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 4.09 ක පිරිහීමක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ උපදේශක ආදායම රු.මිලියන 3.51 කින් පහල යාම සහ භූ තාක්ෂණික හා ඉංජිනේරු අංශයේ ආදායම රු.මිලියන 11.39 කින් පහල යාම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.මිලියන 11.23 වූ අතිරික්තය 2014 වර්ෂයේ රු.මිලියන 62.75 ක් දක්වා වර්ධනය වී තිබුණ ද එතැන් සිට අඛණ්ඩව පිරිහී සමාලෝචිත වර්ෂය වන විට රු.මිලියන 43.83 ක් වී තිබුණි. එහෙත් සේවක පාරිශ්‍රමික රජයට ගෙවූ බදු සහ ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.මිලියන 147.68 ක් වූ දායකත්වය 2017 වර්ෂය වන විට රු.මිලියන.416.76 ක් දක්වා අඛන්ඩව වර්ධනය වී තිබුණි.

සමාලෝචිත වර්ෂය තුළදී පරිසර අධ්‍යයන හා සේවා සහ ගොඩනැගිලි ද්‍රව්‍ය යන අංශ බාහිර ආයතන වෙත සේවා සැපයීම මගින් එම අංශවල සමස්ථ ආදායම වන රු.මිලියන 91.61 න් සියයට 90 ට වඩා වැඩි ප්‍රතිශතයක් සංවිධානය උපයාගෙන තිබුණු ආදායම් වූ අතර නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ සහ මානව ජනාවාස සැලසුම් හා පර්යේෂණ යන අංශ එම අංශ වල ආදායම් ලෙස දක්වා තිබුණ රු.මිලියන 586.77 න් සියයට 75 කට වඩා වැඩි ප්‍රතිශතයක් භාණ්ඩාගාර ප්‍රදාන විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**4.1 කාර්යසාධනය**

-----------------

**4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

---------------------------------------

නායයෑම් අවදානම සම්බන්ධයෙන් තක්සේරු සහතික නිකුත් කිරීමේ හා අයදුම්පත් ලැබුණු දින සිට සති 2 ක කාලයක් තුළ සහතිකපත් නිකුත් කළ යුතු වුවද මහනුවර දිස්ත්‍රික් කාර්යාලයට අයදුම්පත් ලැබී සහතිකපත් නිකුත් කිරීමට මාස 03 කට අධික කාලයක් ගතවී තිබුණ අවස්ථා 14 ක් සහ කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලයට ඒ සඳහා මාසයකට අධික කාලයක් ගතවූ අවස්ථා 417 ක් සිදුකල නියැදි පරීක්ෂාවේදී හඳුනාගත හැකි විය එමෙන්ම සහතිකපත් පිළියෙල කර ඇති නමුත් ඉල්ලුම්කරුවන් වෙත නිකුත් නොකර මාසයකට අධික කාලයක් රඳවාගෙන තිබුණු අවස්ථා 50 ක් මහනුවර දිස්ත්‍රික් කාර්යාලයේ සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී හඳුනාගෙන තිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---------------------------------

පහත සඳහන් නිරික්ෂණ කරනු ලැබේ.

(අ) පර්යේෂණ සංවිධානය සඳහා නීතිමය තත්වය ප්‍රදානය කිරීම වෙනුවෙන් පනතක් පිළියෙල කිරීම සඳහා ඉදිරිපත් කර තිබුණු කැබිනට් පත්‍රිකාවට 2010 ජූනි 02 දින අනුමැතිය ලැබී තිබුණ අතර ඒ අනුව පිළියෙල කළ පනත් කෙටුම්පත 2012 සැප්තැම්බර් 10 වන දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුකර තිබුණි. කෙසේ වෙතත් අදාල පනත 2017 දෙසැම්බර් 31 දින වනතුරුත් පාර්ලිමේන්තුවෙන් සම්මත කරවාගෙන නොතිබුණි.

(ආ) ජපන් අන්තර් ජාතික සහයෝගිතා ආයතනය මගින් මූල්‍යාධාර සපයා තිබුණු නායයෑම් අවදානම් අවම කිරීම උදෙසා වූ තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතියේ කටයුතු වලට අදාළ වන දේශීය බදු ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබා දී තිබුණු රු.මිලියන 17 ක මුදලින් ප්‍රවර්තන වර්ෂය අවසානයේ වැය නොකර ඉතිරිව තිබුණු රු.මිලියන 7.59 ක මුදල භාණ්ඩාගාර අනුමැතියක් ලබා නොගෙන නායයෑම් අවදානම් කළමනාකරණ අංශයේ ආදායමක් වශයෙන් සලකා ගිණුම්ගත කර තිබුණි.

(ඇ) විශේෂ භූමි පරීක්ෂණ කටයුතු සඳහා සංවිධානය වෙත මහා භාණ්ඩාගාරයෙන් ලබා දී තිබුණ රු.මිලියන 54.60 ට අරණායක ප්‍රදේශයේ නායයෑමෙන් අනාථ වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීමේ කටයුතු වලදී පර්යේෂණ සංධානය විසින් වැයකර තිබුණු රු.මිලියන 6.88 ක් මහා භාණ්ඩාගාර අනුමැතියක් ලබා නොගෙන හිලව් කර තිබුණි.

(ඈ) පුස්සල නවෝදා විද්‍යාලයේ සහ බදුල්ල වැවේගම රෝහලේ සිදු කළ නාය යෑම් අවම කිරීමේ ව්‍යාපෘතිවල ඉදිකිරීම් කොන්ත්‍රාත් ලබාගෙන තිබු කොන්ත්‍රාත්කරු අදාල කොන්ත්‍රාත්තු 2016 මාර්තු 04 වන දින සහ 2016 අප්‍රේල් 08 වන දින අතහැරීම හේතුවෙන් සංවිධානය වෙත සිදුවූ අලාභයන් ආවරණය කර ගැනීම සඳහා එම ව්‍යාපෘති වල අත්තිකාරම් මුදලින් පියවාගෙන නොතිබුණු රු.මිලියන 1.66 ක මුදල සහ එම ව්‍යාපෘතිවල කාර්යසාධන ඇපකර වටිනාකම වූ රු.මිලියන 1.57 ක මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3 අරමුදල් ඌන උපයෝජනය**

---------------------------------

පහත සඳහන් නිරික්ෂණ කරනු ලැබේ.

(අ) පර්යේෂණ සංවිධානය නමින් ජංගම ගිණුමක් සහ ඉතිරි කිරීමේ ගිණුමක් රාජ්‍ය බැංකුවක පවත්වා ගෙනයනු ලබන අතර සෑම මසකම වැඩකරන අවසන් දිනයේ ජංගම ගිණුමෙහි රු.මිලියන 50 ක ශේෂයක් ඉතිරිවන පරිදි වැඩිපුර පවතින මුදල් ස්වයංක්‍රීයව ඉතිරි කිරීමේ ගිණුමෙහි තැන්පත් කරණු ලබයි. ඒඅනුව 2017 දෙසැම්බර් 29 දින රු.මිලියන 356.19 ක් ඉතිරි කිරීමේ ගිණුමෙහි තැන්පත් කර තිබුණු අතර 2017 වර්ෂය පුරාම ඉතිරිකිරීමේ ගිණුමෙහි රු.මිලියන 331.69 ත් රු.මිලියන 556.97 ත් අතර ශේෂයක් පැවතුණි.

(ආ) ප්‍රජා මූලික ආපදා අවම කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2015 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් රු.මිලියන11.02 ක මුදලක් පර්යේෂණ සංවිධානය වෙත ලැබී තිබූ අතර 2016 වර්ෂය තුලදී රු.මිලියන 6.00 ක් උපයෝජනය කර තිබුණි. ඉතිරිව පැවති රු.මිලියන 5.02ක මුදල 2017 දෙසැම්බර් 31 දින වන විටත් උපයෝජනය නොකර පැවතුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පර්යේෂණ සංවිධානය සඳහා අනුමත සේවක සංඛ්‍යාවට විද්‍යාඥ තනතුරු 129 ක් ඇතුළත් වූ නමුත් 2017 දෙසැම්බර් 31 දිනට සේවයේ නියුක්ත ස්ථිර කාර්ය මණ්ඩලයේ වූ විද්‍යාඥයින් සංඛ්‍යාව 115 ක් පමණක් විය. කෙසේ වෙතත් විද්‍යාඥ තනතුරු සඳහා පැවරුම් පදනම මත නිලධාරීන් 36 දෙනෙකු, දෛනික පදනම මත නිලධාරීන් 22 සහ පුහුණුවන නිලධාරීන් 10 දෙනෙකු සේවයේ යෙදවීමට පර්යේෂණ සංවිධානය කටයුතු කර තිබුණි. එසේ වුවත් අතිකාල වියදම් දීමනාව සඳහා හිමිකමක් නොමැති ශ්‍රේණිවල නිලධාරීන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල රු.මිලියන 11.07 ක මුදලක් අතිකාල වශයෙන් ගෙවා තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනිම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ "2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.ඊට අදාළව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) "2030 න්‍යාය පත්‍රය" පිළිබඳව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් දැනුවත් වී තිබුණද, සංවිධානයේ විෂය පථයට ගැනෙන කාර්යයන් න්‍යාය පත්‍රයේ අරමුණු වලට සෘජුවම සම්බන්ධයක් නොමැති බැවින් එහි ඉලක්කගත දර්ශක හඳුනා ගැනීමට දුෂ්කර වී ඇති බව අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් දන්වා තිබුණි.

(ආ) තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම සඳහා ආයතනය විසින් හඳුනාගත් කාර්යයන් තම වාර්ෂික සැලැස්මට ඇතුළත් කර නොතිබුණු අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුළත් කර නොතිබුණි.

## 6. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 6.1 අභ්‍යන්තර විගණනය

පර්යේෂණ සංවිධානයේ අභ්‍යන්තර විගණන අංශය ප්‍රධාන අභන්තර විගණක සහ එක් සහායක නිලධාරිනියකගෙන් පමණක් සමන්විතව තිබුණු අතර ඒ හේතුවෙන් සංවිධානයේ ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල ප්‍රමාණවත් විගණනයක් සිදු කිරීමට අපහසු වී තිබුණි.

## 6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.2.1 ප්‍රසම්පාදනයන්

(අ) පර්යේෂණ සංවිධානය විසින් කුලී පදනම මත මෝටර් වාහන සපයාගැනීම සඳහා වූ ප්‍රසම්පාදන සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2017 අගෝස්තු 01 සිට 2018 අගෝස්තු 31 දක්වා කාලය සඳහා කුලී පදනම මත මෝටර් වාහන 11 ක් ලබාගැනීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් සමග රු.මිලියන 36.83 ක ගිවිසුමකට එළඹ තිබුණද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 වගන්තිය පරිදි කාර්යසාධන සුරක්ෂණයක් ලබා නොගැනීම හේතුවෙන් ගිවිසුම් ප්‍රකාරව සැපයුම්කරු කටයුතු නොකිරීම නිසා ආයතනයට සිදුවූ රු.මිලියන 1.84 ක පාඩුවෙන් අයකර ගැනීමට හැකි වූයේ රු.මිලියන 0.28 ක් පමණක් වීය.

(ii) ලංසු කැඳවීමේ ලේඛණයේ 1(අ) ඡේදය ප්‍රකාරව සියලුම කුලී වාහන 2005 වර්ෂය හෝ ඊට පසු නිෂ්පාදනය කළ වාහන විය යුතු වුවද කොන්ත්‍රත් කරු විසින් ධාවනය සඳහා යෙදවා තිබු වාහන 11 න් වාහන 5 ක පමණක් ලියාපදිංචි සහතික විගණනය වෙත ඉදිරිපත් කල අතර ඉන් වාහන 02 ක් 2005 වර්ෂයට පෙර නිෂ්පාදනය කළ වාහන බව අනාවරණය විය.

(ආ) නව විද්‍යාගාර ගොඩනැගිල්ල ඉදි කිරීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරණු ලැබේ.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8 වගන්තිය පරිදි ලංසු භාර ගැනීම අවසන් කිරීමට නියමිත වේලාවට ප්‍රථමයෙන් ලැබී ඇති සියලුම ලංසු ඇගයීමට භාජනය කළ යුතු වුවත් ඊට පටහැනි ලෙස අවම මිල සහිත ලංසුව පමණක් ඇගයීමට භාජනය කර තිබූ අතර එම කොන්ත්‍රාත්කරු විසින් ඉදිකර තිබුණු ගොඩනැගිල්ලක් සඳහා යාපනය මහා නගර සභාව විසින් අනුකූලතා සහතිකය නිකුත් කර නොතිබුණු බැවින් තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයන් විසින් අදාළ ගොඩනැගිල්ල භෞතිකව පරීක්ෂා කර ඉදිකිරීම හොඳ තත්ත්වයේ පවතින බවට තහවුරුවක් ලබා දී එම කොන්ත්‍රාත්කරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට නිර්දේශ කර තිබුණි. ඒ අනුව ඇගයීම විනිවිද භාවයෙන් සිදු වී නොමැති බව නිරීක්ෂණය විය.

(ii) 2016 දෙසැම්බර් 31 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණ ද ගිවිසුම අත්සන් කර තිබුණේ 2017 පෙබරවාරි 16 දින දීය. ඒ අනුව ගිවිසුම් අත්සන් කිරීම සඳහා දින 45ක කාල ප්‍රමාදයක් සිදු වී තිබුණි. ගිවිසුම අනුව ඉදිකිරීම් කටයුතු 2017 ඔක්තෝබර් 12 දින වන විට නිමකල යුතු වුවත් 2017 දෙසැම්බර් 31 දින වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 26.75 ක් පමණ විය. මහා භාණ්ඩාගාරය මගින් 2015 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා මේ සඳහා රු.මිලියන 350 ක් නිදහස්කර තිබුණද 2017 වර්ෂය අවසන් වන විටත් වැයකර පැවතියේ රු.මිලියන 121.45 ක් පමණක් විය.

(iii) කොන්ත්‍රාත් ගිවිසුමෙහි 14.5 ඡේදය ප්‍රකාරව අන්තර් ගෙවීම් බිල්පතක අවම වටිනාකම රු.මිලියන 12.50 ක් විය වුවත් එම වගන්තියට පටහැනිව රු.මිලියන 1.39 හා රු.මිලියන 6.07 අතර වටිනාකම් සහිත අන්තර් ගෙවීම් බිල්පත් 06 ක් සඳහා ප්‍රවර්තන වර්ෂය තුළදී ගෙවීම් කර තිබුණි.

(ඇ) ස්වයංක්‍රීය වර්ෂාමාන ස්ථාපිත කිරීම සම්බන්ධ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(i) 2016 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන උපයෝජනය කරගෙන වර්ෂාමාන 51ක් ස්ථාපිත කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමට ලංසු කැඳවා තිබූ අතර ඉදිරිපත් කර තිබු අවම මිල රු.මිලියන 38.43 ක් වූ අතර වර්ෂයකින් නිම කිරීම සඳහා 2016 අගෝස්තු 08 දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මෙම වර්ෂාමාන පද්ධතියේ වැඩි දියුණු කිරීම් කළ යුතු බව සංවිධානය විසින් කොන්ත්‍රාත්කරු වෙත

දන්වා තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 3.35 ක අමතර ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. එම අමතර ඇස්තමේන්තුවේ මිල ගණන් සම්බන්ධයෙන් මොරටුව විශ්ව විද්‍යාලයේ විශේෂඥ උපදෙස් ලබාගෙන තිබුණු අතර එම උපදෙස්වලට අනුව අධික මිල ගණන් ඇතුලත් ව පැවති බව දන්වා තිබුණද විශේෂඥ උපදෙස් නොතකා මුල් කොන්ත්‍රාත්කරුටම එම කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(ii) 2017 වර්ෂයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන තවත් වර්ෂාමාන 50 ක් ස්ථාපිත කිරීම සඳහා තරගකාරී ලංසු කැඳවා තිබූ අතර එම ලංසු ඇගයීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.10 සහ 7.4 ඡේදවල නිර්නායක වලට පටහැනිව මාස 05 කට අධික කාලයක් ගතකර තිබුණි. අවම ලංසු ඉදිරිපත් කර තිබූ සමාගම ලංසු ඉදිරිපත් කිරීමෙන් පසු 2018 අගෝස්තු 28 දින වෙනත් සමාගමක් සමග ඒකාබද්ධ වී නව සමාගමක් පිහිටුවා තිබූ අතර එම නව සමාගම නමින් කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. ඒ අනුව ලංසු ඉදිරිපත් නොකළ ආයතනයක් වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

### 6.2.2 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

සංවිධානය වෙත ලැබෙන කොන්ත්‍රාත් සඳහා උප කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීම සම්බන්ධයෙන් සිදුකරන ලද විගණනයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) කෑගල්ල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති 03 ක් කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු වෙත ප්‍රදානය කර තිබුණ අතර කොන්ත්‍රාත්කරුවන් විසින් එම කොන්ත්‍රාත් උප කොන්ත්‍රාත්කරුවන්ට පවරා තිබුණ නමුත් ඒ සඳහා පර්යේෂණ සංවිධානයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් 2017 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 05 සිට සියයට 50 දක්වා පරාසයක පැවති බව නිරීක්ෂණය විය.

(ආ) කොළඹ නගරය තුළ මහල් 56ක ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් භූමි පරීක්ෂාවක් සිදුකර ගැනීම සඳහා පෞද්ගලික ආයතනයකින් සංවිධානය වෙත වටිනාකම රු.මිලියන 21.80 ක් වූ කොන්ත්‍රාත්තුවක් ලැබී තිබුණි. සංවිධානයේ භූ තාක්ෂණික අංශයේ නිලධාරීන් යොදවා ඉහත කොන්ත්‍රාත්තුව දින 90 කින් නිම කිරීමට සැලසුම්කර තිබුනද පසුව එම කාර්යයෙන් කොටසක් සීමිත ලංසු කැඳවා උප කොන්ත්‍රාත් ලබා දී තිබුණි. මුළු කොන්ත්‍රාත්තුවට අනුව භූ විදුම් 46 ක් සිදු කිරීමට නියමිත වූ අතර ඉන් භූ විදුම් 23 ක් සිදු කිරීම සඳහා උප කොන්ත්‍රාත් ලබා දී තිබුණි. ව්‍යාපෘතිය උපකොන්ත්‍රාත් ලබාදීම සඳහා අනුමැතිය ලබාගැනීම සහ සියළුම ප්‍රසම්පාදන කටයුතු දින 03 ක් වැනි කෙටිකාලයක් තුල සිදුකර තිබීම ප්‍රශ්නකාරී වූ අතර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා ලංසු විවෘත කළ දින සිට දින 47 ක කාලයක් ගත කර තිබුණි. ප්‍රථමයෙන් දින 90 කින් අභ්‍යන්තර කාර්යය මණ්ඩලය මගින් ඉටු කිරීමට සැලසුම් කළ ව්‍යාපෘතිය, ආරම්භ කර දින 114 කට පසු උප කොන්ත්‍රාත් ලබා දී තිබුණි. ඒ අනුව එම කාලය තුල අභ්‍යන්තර කාර්යය මණ්ඩලය යොදවා කාර්යය ඉටු කිරීමේ හැකියාව පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද මහවැලි ගංගා ද්‍රෝණි ආශ්‍රිත ගොවි ජනපදවල නාය යෑම් අවදානම් අවම කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් සංවිධානය වෙත ලැබී තිබුණි. ඒ සඳහා ගිවිසුම් ගත මුදල රු.මිලියන 20.60 ක් විය. ඒ අනුව වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පූර්ව අනතුරු ඇඟවීමේ ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම සඳහා සංවිධානය මගින් ලංසු කැඳවා උප කොන්ත්‍රාත්කරුවකු තෝරාගන තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.10 සහ 7.4 ඡේද ප්‍රකාරව ලංසු වලංගු කාල සීමාව තුල ඇගයීම සිදුකර නොතිබුණි. මෙම වාර්තාවේ 6.2.1 (ඇ) (ii) ඡේදයේ සඳහන් පරිදි ලංසු ඉදිරිපත් නොකළ සමාගමක් නමින් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

(ඈ) මහනුවර දිස්ත්‍රික්කයේ පාසැල් 18 ක හා මහා මාර්ග 11 ක අස්ථාවර බෑවුම් නායයෑම් අවම කිරීමේ කටයුතු සඳහා උපදේශක සේවා සැපයීමේ ගිවිසුමකට 2015 නොවැම්බර් 26 දින එළඹ තිබුණි. මෙකි කාර්යයන් 2017 වර්ෂය වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණ ද විගණිත දිනය වූ 2018 ජූනි 30 වනවිට ද පාසැල් 2 ක හා මහාමාර්ග 4 ක වැඩ ආරම්භ කර නොතිබුණි. එමෙන්ම පාසල් 8 ක භෞතික ප්‍රගතිය සියයට 25 ත් 83 අතර පැවතුනි. මාහා මාර්ග 04 ක භෞතික ප්‍රගතිය සියයට 45 ත් 95 අතර විය.

## 6.3 අයවැය පාලනය

---------------------

අයවැය ලේඛනය සඳහා වූ මූල්‍යමය ඉලක්ක පිළියෙල කිරීමේදී ඒ සඳහා ප්‍රමාණවත් අවධානයක් සහ එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා නොතිබුණු අතර 2017 අගෝස්තු මාසය දක්වා වූ සත්‍ය වියදම් හා ආදායම් පදනම් කර ගෙන නැවත සැප්තැම්බර් මාසයේ දී අය වැය ලේඛනය සංශෝධනය කර තිබුණි. මේ හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කර නොතිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විගණන විමසුම් මාර්ගයෙන් වරින් වර පර්යේෂණ සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන අඩුපාඩු කෙරෙහි තවදුරටත් අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | දිස්ත්‍රික් කාර්යාලවල ලේඛන පැවැත්වීම | පැමිණීමේ ලේඛන, නිවාඩු ලේඛන, බැහැර යාමේ ලේඛන, ඉන්වෙන්ට්‍රි ලේඛන යාවත්කාලීනව නිසිපරිදි නඩත්තු නොකිරීම. |
| (ආ) | දිස්ත්‍රික් කාර්යාලවල අග්‍රිම පියවීම, | දිස්ත්‍රික් කාර්යාලවල ගෙවීම් සඳහා වවුචර් භාවිතා නොකිරීම හා බිල්පත් පියවීම යාවත්කාලීනව සිදු නොවීම. |
| (ඇ) | ණය ශේෂ අයකර ගැනීම | දිගු කාලීනව හිගහිටි පැවති ණය ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඈ) | ප්‍රසම්පාදන කටයුතු | නාය යෑම් අවදානම් අවම කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යාවත්කාලීනව ප්‍රසම්පාදන කටයුතු සිදු නොකිරීම. |
| (ඉ) | දිස්ත්‍රික් කාර්යාලවල භූමි යෝග්‍යතා සහතික නිකුත් කිරීම | භූමි යෝග්‍යතා සහතික ලබා ගැනීම වෙනුවෙන් ලැබෙන ඉල්ලුම්පත් සහ සහතිකපත් නිකුත් කර නොමැති අවස්ථා පහසුවෙන් හඳුනාගත හැකි ආකාරයට ලේඛන නඩත්තු නොකිරීම,ක්ෂේත්‍ර පරීක්ෂාවන් පිළිබඳ වාර්තා ගොනුගත කර නොතිබීම, අයදුම්පත්වල උප කාර්යල විසින් සම්පූර්ණ කළ යුතු කොටස සම්පූර්ණ කර නොතිබීම. |